**සිංහල භාෂාව හා සාහිත්‍ය**

**111 කොටස** **11 ශ්‍රේණිය**

විභාග අංකය :……………..

---

වැදගත් උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්ණ **පහකට** පමණක් උත්තර සපයන්න.

1, 2, 3, 4 ප්‍රශ්ණ වලටත් 5, 6, 7 ප්‍රශ්ණ වලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්ණ පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(1) (i) සිට (X) තෙක් ඇති සියළුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1 (අ) "පැදී දියට බොරදිය" "කාටත් මා එපාවෙලා" යන කෙටිකථා සංග්‍රහයන්හි කතුවරයා කවුද?

(ආ) "අපටත් දවසක ඉර පායාදෝ" කෙටිකථාව රචනා කර ඇත්තේ කුමණ දෘෂ්ඨි කෝණයකින් ද?

2 "මේ මුළු පොළවේ තොප තරම් වෛද්‍යාචාරී කෙනෙක් නැත"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?

(ආ) මෙම ප්‍රකාශය සඳහන් කථා වස්තුව ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

3 නේරංජනේ ගංගාවේ සුදු වැල්ලේ

නේරංජනන් ඉස්නානේ නැවිල්ලේ

(අ) මේ කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) යසෝදරාවත රචනා කර ඇත්තේ කුමන කාව්‍ය සම්ප්‍රදායෙන් ද?

4 සබඳ රට ආලය නොකරව ඒ ලද නොහැක්ය

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ආ) සද්ධර්මරත්නාවලිය රචනා වූ සාහිත්‍ය යුගය කුමක් ද?

5 (අ) කිසා ගෝතමියක නොවේ පද්‍ය පංතියේ රචකයා කවුද?

(ආ) ඔහු විසින් රචනා කරන ලද කෙටි කථා සංග්‍රහයක් නම් කරන්න?

6 නුවෙන් අප <u>අයැති</u>

පසු <u>පෙය</u> දෙන්ට මං නැති

(අ) ඉරි ඇඳි පද වල අර්ථය ලියන්න.

(අ) කාව්‍ය ශේකරයට පදනම් වු ජාතක කථාව කුමක් ද?

7 (අ) මඟුල් ප්‍රසථාව නාට්‍ය රචනා කර ඇත්තේ කුමන ශෛලියෙන් ද?

(ආ) කාව්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ කතුවරයා කවුද?

8 (අ) සද්ධර්මාලංකාර කෘතියේ කතුවරයා කව්රුන් ද ?

(ආ) උත්තරෝලිය කතා වස්තුව රචනා කිරීමේ අරමුණ කුමක් ද ?

9 "දුප්පත් මිනිහෙකුට මේ ලෝකයේ කිසිම හවහරනක් නෑ"
(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
(ආ) මෙය ශ්‍රවණය කළේ කවුද?

10 (අ) වේදබ්භ ජාතකය දේශනා කළේ කවුරුන් අරහයා ද ?
(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ කෘතිය කුමක් ද ?

02 පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ වල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස් වල අර්ථය වෙන වෙනම ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) අතක් බෝසතුගේ ළෙයි තබමින් විමසා
මදක් සැලි සැලී පණනල තිබෙන නිසා
**<u>පසක් තෙදැති</u>** දෙවියන් යදිමින් නොලසා
**<u>නැතත් කන්නලව</u>** බස් තෙපලයි මෙලෙසා

(ii) මේ හැටි **<u>උජාරුවට</u>** මේ ළමයා ඇඳ පැළඳ ගෙන දිලිසෙන සපත්තු දෙකක් දාලා පුතා මේ බැරක් යනව ද

(iii) **<u>ගැටවටු ගන්වා</u>** සිවුරු වැළඳ ගෙන **<u>පාත්‍රය පටවා ගෙන</u>** දකුණු මුහුදු ගමන් ගත් නැවක් මෙන්

(iv)මාගේ **<u>සුරුකම්</u>** බලා වදාළ මැනවැයි **<u>වාසි කියාලා</u>** එවිටම නියහස්සෙහි තිබූ ඖෂධය

(ලකුණු 5 6 20)

3, 4 යන ප්‍රශ්ණ සඳහා වන උත්තරයක වචන 125 ක් පමණ තිබීම සෑහේ

3 සඳකිඳුරු දා තම පාඨකයා අතර ආකර්ශනයට ලක් වූයේ
1 අවස්ථා නිරූපනය හා
2 සරල බස් වහර යන කරුණු නිසාය එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න

**නැතහොත්**

සද්ධර්මාලංකාර කතුවරයාගේ පරමාර්ථය වූයේ
1 ශ්‍රද්ධා භක්තිය ජනනය කිරීම
2 පුද්ගලයා කුසලය කෙරෙහි යොමු කිරීම
මෙම කරුණු නිරූපණය වන පරිදි නිදසුන දෙක බැගින් දෙමින් විමසන්න.

4 කිසාගෝතමියක නොවේ පද්‍ය පංතිය තුළින් කතුවරයාගෙ
1 පරිකල්පන ශක්තිය
2 සමාජ විෂමතාව සංයමයෙන් ඉදිරිපත් කිරීම මැණවින් නිරූපනය වේ

නිදසුන් දෙක බැගින් දෙමින සාකච්ඡා කරන්න

නැතහොත්

සමාජයේ පීඩිත පන්තියට එල්ලවන දුක්ගැහැට හා පීඩා පිළිබඳව
(i) සිරියාවතීගේ මව තුළ වූ ජීවිතාවබෝදය
(ii) ඇය අවස්ථාවෝචිතව කටයුතු කළ ආකාරය යන කරුණු වලට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න

5 6 7 ප්‍රශ්ණ වලින් එකකට පමණක් උත්තර ලියන්න උත්තරය වචන 100 පමණ සෑහේ

5 එච්.එම් කුඩලිගම කවියාගේ **වැස්ස** පද්‍ය පන්තිය උචිත උපමා රූපක යොදා ගැනීම නිසා වඩාත් රසවත් වී ඇත නිදසුන් දෙමින් විමසන්න.

6 “ජීවක අභියෝග හමුවේ නොසැලුණු චරිතයකි” නිදසුන් මගින් පැහැදිලි කරන්න.

7 බක්මහේ අසිරිය රසාලිප්ත ලෙස ඉදිරිපත් කිරීමට අරිසෙන් අහුබුදු කවියා සමත් වී ඇත උදාහරණ දෙමින් මෙය සනාථ කරන්න.